Australian Government

COVID-19 VACCINATION

# කෝවිඩ්-19 එන්නත් දිනයේදී ඔබගේ නේවාසික වයෝවෘද්ධ රැකවරණ පහසුකමේ බලාපොරොත්තු විය හැකි දේ

## නේවාසිකයන්, පවුලේ අය, රැකවරණකරුවන් සහ හිතවත් අය සඳහා තොරතුරු

ඕස්ට්‍රේලියානු රජය සතුව කෝවිඩ්-19 එන්නත ඕස්ට්‍රේලියාවේ සිටින සෑම අයෙකුටම ලබා දීමට උපාය මාර්ගයක් ඇත.

කෝවිඩ්-19 එන්නත ප්‍රථමයෙන්ම ලැබීමට තෝරා ගත් අය අතර නේවාසික වෘද්ධෝපගත රැකවරණ සේවකයන් සහ නේවාසිකයන් සිටී. මෙය [ඕස්ට්‍රේලියාවේ කෝවිඩ්-19 එන්නත ජාතික වශයෙන් ලබාදීමේ උපායේ පළමු අදියරේ ( 1අ අදියර)](#) කොටසක්වේ.

නේවාසික වෘද්ධෝපගත රැකවරණ සේවකයන් සහ නේවාසිකයන් සඳහා කෝවිඩ්-19 එන්නත ලබාදීම නේවාසික වෘද්ධෝපගත රැකවරණ පහසුකම්වල සිදුවේ. ඔබගේ නේවාසික වෘද්ධෝපගත රැකවරණ පහසුකම් මගින් එන්නත් දිනය සම්බන්ධයෙන් ඔබට දැනුම් දෙනු ඇත.

මෙම ලියවිල්ල මගින් එන්නත ලබාදෙන දින තෙක් සහ ඔබගේ එන්නත් දිනයේ සිදුවන දේවල් සම්බන්ධ තොරතුරු ඔබට, ඔබගේ පවුලේ අයට, රැකවරණකරුවන්, සහ හිතවත් අය හට ලබා දෙනු ඇත.

## එන්නත් දිනට ප්‍රථම

- ඔබගේ නේවාසික වෘද්ධෝපගත රැකවරණ පහසුකම් වෙත එන්නත ලබා දීමට කටයුතු සැලසුම් කරනු ඇත.
- ඕස්ට්‍රේලියානු රජය මගින් ඔබගේ නේවාසික වෘද්ධෝපගත රැකවරණ පහසුකම වෙත පැමිණ නේවාසිකයන් සහ කාර්ය මණ්ඩලය වෙත එන්නත ලබාදීම සඳහා සායනික ශ්‍රම බලකායක් සේවයේ යොදවාගෙන ඇත. එන්නත් ලබාදීමට ප්‍රථම එන්නත් දිනය ආරක්‍ෂාකාරී සහ කාර්යක්‍ෂම ආකාරයට සංවිධානය වන බවත සහතික කිරීම සඳහා මෙම සායනික සේවකයන් ඔබගේ පහසුකම සමඟ ඉතා සමීපයෙන් කටයුතු කරනු ඇත.
- ඔබගේ නේවාසික වෘද්ධෝපගත රැකවරණ පහසුකම මගින් ඔබ සහ ඔබ වෙනුවෙන් තීරණ ගත හැකි අය (එවැනි අයෙකු සිටීනම්) වෙතින් කෝවිඩ්-19 එන්නත ලබා ගැනීම සම්බන්ධ අනුමැතිය ඉල්ලා සිටිනු ඇත.
  - ඔබ හට තොරතුරු ලබා දෙන අතර ඒ මගින් ඔබට කෝවිඩ්-19 එන්නත සම්බන්ධයෙන් දැනුවත් තීරණ ගත හැකිවේ. ඔබ හට දැනටමත් ඔබගේ පහසුකම මගින් මෙම තොරතුරු ලබාදී නොමැතිනම්, සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙතින් ඔබට පිටපතක් ලබාගත හැක.
  - කැමැත්ත ලබාදීමට පෙර ඔබ, ඔබගේ පවුලේ අය, රැකවරණකරු සහ තීරණ ගන්නා අය විසින් ඔබගේ පහසුකමේ සිටින සායනික කාර්ය මණ්ඩලය, පවුලේ වෛද්‍යවරයෙකු හෝ වෙනත් සෞඛ්‍යය වෘත්තිකයෙකු සමඟ එන්නතෙහි ප්‍රතිලාභ සහ අවදානම, සහ ඔබට කෝවිඩ්-19 එන්නත ලබා ගැනීම සුදුසුද යන්න අම්බන්ධයෙන් සාකච්ඡා කල හැකිය.
- ඔබගේ පහසුකමේ සිටින කායී මණ්ඩලය විසින් ඔබට එන්නත ලබාදීම සුදුසුද යන්න තීරණය කිරීමට ඔබගේ සෞඛ්‍ය තත්වය පරීක්‍ෂා කර බලනු ඇත. ඔබගේ සෞඛ්‍යය තත්වය සම්බන්ධයෙන් ඔබගේ පහසුකම හට කිසියම් සැකයක් ඇතිනම්, පවුලේ වෛද්‍යවරයෙකු සමඟ සාකච්ඡා කරනු ඇත. ඔබගේ සෞඛ්‍යය සහ කෝවිඩ්-19 එන්නත සම්බන්ධයෙන් ඕනෑම අවස්ථාවක ඔබගේ පවුලේ වෛද්‍යවරයා සමඟ සාකච්ඡා කිරීමට තීරණය කල හැකිය.
- ඔබ කෝවිඩ්-19 එන්නත ලබා ගැනීම සඳහා කැමැත්ත ලබාදුනි නම්, ඔබගේ නේවාසික වයෝවෘද්ධ රැකවරණ පහසුකම මගින් එන්නත ලබාදීම සඳහා ඔබව ලියාපදිංචි කරනු ඇත. ඔබගේ පහසුකම මගින් එන්නත් දිනය සඳහා එන්නත් කාර්ය බලකාය සමඟ සියළු කටයුතු පිළියෙල කරනු ඇත.
- කෝවිඩ්-19 එන්නත ලබා ගැනීම සඳහා ඔබගේ පවුලේ වෛද්‍යවරයා විසින් නියම කිරීමක් ලබා ගැනීම අවශ්‍ය නොවේ.
- වයෝවෘද්ධ රැකවරණ උපදේශකයෙකු ලබා ගැනීම සඳහා ඔබට අයිතිය ඇත. OPAN ඔස්සේ ලබා ගන්නා සේවාව, නොමිළේ සහ රජයේ සහ වයෝවෘද්ධ රැකවරණ සපයන්නන්ගෙන් ස්වාධීනවේ. ඔබගේ ප්‍රාන්තයේ හෝ ටෙරිටරියේ වයෝවෘද්ධ රැකවරණ උපදේශකයන් දුරකථන 1800 700 600 ඔස්සේ හෝ opan.com.au ඔස්සේ ලබාගත හැකිය.

## එන්නත ලබාදෙන දිනයේ

- ඔබ එන්නත ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, එන්නත් දිනයේ ඔබ සනීපෙන් සිටින බව සනාථ කිරීම සඳහා පහසුකමේ සිටින සායනික කාර්ය මණ්ඩලය ඔබව පරීක්ෂා කර බලනු ඇත. එන්නත් දිනයේ රෝගී තත්වයක් ඇතිවුවහොත්, ඔබගේ නේවාසික වෘද්ධෝපගත රැකවරණ පහසුකම මගින් සාමාන්‍ය වෛද්‍යවරයෙකු හා සම්බන්ධවී ඔබගේ එන්නත ලබා දිය හැකිද හෝ පසු දිනකට එය කල් තැබිය යුතුද යන්න තීරණය කරනු ඇත.
- එන්නත ලබාදෙන දිනයේදී ඔබගේ නේවාසික වෘද්ධෝපගත රැකවරණ පහසුකම වෙත ඔබට උපකාර කිරීම සඳහා උපකාරක පුද්ගලයෙකු පැමිණීම ඔබට තෝරා ගත හැකිය. මෙයට ඔබට තොරතුරු පරිවර්තනය කර දෙන හෝ ඔබට කනස්සල්ලක් ඇතිවුවහොත් ඔබට විශ්වාසය තහවුරු කර දෙන පුද්ගලයෙකු ඇතුලත් විය හැකිය.
- ඕනෑම එන්නතක් මෙන්, කෝවිඩ්-19 එන්නත ලබා ගැනීමෙන් පසුවත්, ඔබට අතුරු ආබාධ ඇතිවිය හැකිය. ඔබට එන්නත ලබා දීමෙන් පසුව බලාපොරොත්තු විය හැකි දේ සම්බන්ධ තොරතුරු ඔබට එන්නත ලබා දෙන සායනික සේවකයා විසින් ලබාදෙනු ඇත. මෙම තොරතුරු සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ද ලබාගත හැකිය.
- ඔබට එන්නත ලබා දීමෙන් පසු, ඔබගේ නේවාසික වෘද්ධෝපගත රැකවරණ පහසුකමේ කාර්‍ය මණ්ඩලය ඔබව සමීපව නියාමනය කරනු ඇත. එන්නත ලබා ගැනීමෙන් පසු ඔබට අසනීප තත්වයක් ඇතිවේ නම්, කරුණාකර ඒ බව ඔවුන්ට දැනුම් දෙන්න.

## විශ්වසනීය තොරතුරු සමඟින් යවත්කාලීනවී සිටින්න

පරිවර්තිත තොරතුරු ඇතුළු වැඩිදුර විස්තර සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ කෝවිඩ්-19 එන්නත් වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබා ගත හැකිය. කෝවිඩ්-19 එන්නත් සම්බන්ධ යාවත්කාලීන සඳහාද ඔබට සබ්ස්ක්‍රයිබ් විය හැක.

දුරකථන අංක 1800 020 080 ඔස්සේ ජාතික කොරෝනා වයිරස් උපකාරක දුරකථන අංකය අමතා, අවශ්‍ය නම් භාෂා පරිවර්තකයෙකු ඉල්ලා සිටින්න.

ඔබට කෝවිඩ්-19 සම්බන්ධ කිසියම් කනස්සල්ලක් හෝ ගැටළුවක් සම්බන්ධයෙන් කථා කිරීමට හෝ වයෝවෘද්ධ රැකවරණ සපයන්නා සමඟ සම්බන්ධවීම සඳහා ඔබට උපකාර අවශ්‍ය නම්, වැඩිහිටි අයගේ උපකාරක ජාලය (Older Persons Advocacy Network (OPAN)) හා සම්බන්ධ විය හැකිය. සතියේ දින 7 ම පෙ.ව. 6 සිට ප.ව. 10 දක්වා දුරකථන අංක 1800 237 981 අමතන්න, නැතිනම් covid@opan.com.au. ඔස්සේ ඊමේල් පණිවුඩයක් යවන්න.